ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2016-08-12

පැමිණිලිකාරිය : කේ.සී.එස්. වික්‍රමසිංහ මිය,
55/2, මේෆීල්ඩ් පෙදෙස,
කොළඹ 07.

වගඋත්තරකරු : විදුහල්පති.
තර්ස්ටන් විද්‍යාලය.
කොළඹ 03.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/3939/15</u>**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සදහන් කර ඇත්තේ, තම දරුවා 2016 වසරේදි කොළඹ තර්ස්ටන් විද්‍යාලයේ 1 ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමේ අපේක්ෂාවෙන් "ආසන්නතාවය" යටතේ අයදුම්පත්‍ර යොමු කල බවත්, සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 74ක් උපයා ගත් බවත්ය. නමුත් දරුවා පාසලට ඇතුලත් කොට නොගත් බවත් එමගින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝන වී ඇති බවත් දන්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු දක්වමින් වගඋත්තරකරු සදහන් කර ඇත්තේ "ආසන්නතාවය" යටතේ පැමිණිලිකාරිය ඡන්ද හිමිකම සදහා ලකුණු 35ක් ද, පදිංචිය තහවුරු කිරීමේ වෙනත් ලේඛන 4ක් සදහා ලකුණු 4ක් ද, ආසන්න පාසල් දෙකට ලකුණු 10ක් අඩු කිරීමෙන් පසු මුළු ලකුණු 74ක්ද ලබාදී ඇති බවත්, නමුත් පසුව අභියාචනා මණ්ඩලයේ දී පදිංචිය තහවුරු කිරීම සදහා හිමිකම් ඔප්පුවක් ඉදිරිපත් නොකිරීම මත පදිංචිය තහවුරු කිරීම සදහා ඉදිරිපත් කර තිබූ ලේඛන සදහා ලබාදී තිබූ ලකුණු 4 අහිමි කිරීමට තීරණය කල බවත් ඒ අනුව පැමිණිලිකාරියට අභියාචනා පරීක්ෂණ මණ්ලයේදී ලකුණු 70ක් පමණක් ලබාදී ඇති බවත් දන්වා ඇත. තර්ස්ටන් විද්‍යාලයේ ආසන්නතාවය යටතේ පාසලට ඇතුලත් කොට ගැනීමේ අවසාන

ලකුණු සීමාව ලකුණු 71 බවත්. ඒ අනුව පැමිණිලිකාරිය අවම සුදුසුකම් සපුරා නොමැතිවීම මත තෝරා ගෙන නොමැති බවත් වැඩිදුරටත් දන්වා ඇත.

**කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකාරිය "ආසන්නතාවය" යටතේ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අතර මූල් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 74 ක් උපයා ඇති අතර. මූල් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය තහවුරු කිරීම සඳහා පදිංචි ස්ථානයට අදාළ කිසිදු හිමිකම් ඔප්පුවක් ඉදිරිපත් කොට නොමැත. පදිංචිය තහවුරු කිරීම සඳහා හිමිකම් ඔප්පුවක් ඉදිරිපත් නොකළද පදිංචිය තහවුරු කිරීමේ වෙනත් ලේඛන 4ක් පැමිණිලිකාරිය විසින් මූල් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා ලකුණු 4ක් උපයාගෙන ඇති බව අනාවරණය වී ඇත. නමුත් අභියාචනා පරීක්ෂණ මණ්ඩලය හමුවේ හිමිකම් ඔප්පුවක් ඉදිරිපත් නොකිරීම යන කාරණය මත පදිංචිය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කොට ඇති වෙනත් ලේඛන සඳහා හිමි ලකුණු 4 අහිමි කොට ඇති අතර. එකී ලකුණු 4 අහිමි කිරීම චක්‍රලේඛය ප්‍රකාරව අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින් කුමන නිත්‍යානකූල පදනමක් යටතේ සිදු කොට ඇද්ද යන්න තහවුරු කොට ඉදිරිපත් කිරීමට වගඋත්තරකරු කොමිෂන් සභාව හමුවේ අපොහොසත් වී ඇත.

වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කොට ඇති පැමිණිලිකාරියට අදාළ ලකුණු ලේඛනය පරීක්ෂා කොට බැලීමේදී ඡන්ද හිමිකම සඳහා සම්පූර්ණ ලකුණු 35ක් ලබා දී ඇති අතර පදිංචිය තහවුරු කිරීමේ ලේඛන සඳහා ලබාදී ඇති ලකුණු අපහැදිලිවන බවද ආසන්න පාසල් දෙකක් ලෙස රාජකීය විද්‍යාලය හා ඩී.එස් සේනානායක විද්‍යාලය පමණක් අයත් වන බව පැහැදිලිවම දක්වමින් නමුත් ලකුණු 35ක් පමණක් ඒ සඳහා ලබාදී ඇති බවද නිරීක්ෂණය වේ. ලකුණු අඩුවිය යුත්තේ පාසල් දෙකක් සඳහා නම් අඩු විය යුතු ලකුණු ප්‍රමාණය ලකුණු 10ක් පමණක් වුවද ලකුණු ලේඛනයට අනුව පාසල් 2ක් සඳහා ලකුණු 15ක් අඩු කොට ඇති බව නිශ්චිතවම තහවුරු වී ඇත. එනම් වගඋත්තරකාර තර්ස්ටන් විද්‍යාලීය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය පැමිණිලිකාරිය සම්බන්ධයෙන් ඉතාම අපරීක්ෂාකාරී සහ යුක්ති සහගත නොවන ආකාරයෙන් ක්‍රියා කොට ඇති බව ලකුණු ලේඛන පරීක්ෂා කොට බැලීමේදී කොමිෂන් සභාව හමුවේ තහවුරු වී ඇත. කිසිදු ආකාරයකින් ලකුණු ලේඛනය කියවා තේරුම් ගැනීමට අපහසුවන අතර වගඋත්තරකාර පාර්ශවය ඉදිරිපත් කොට ඇති එකම තර්කය වන්නේ පැමිණිලිකාරිය විසින් හිමිකම් ඔප්පුවක් ඉදිරිපත් කොට නොමැති බව පමණකි.

පැමිණිලිකාරිය පදිංචිව ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පවතින පදිංචි ස්ථානයක වන අතර ඒ බව තහවුරු කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කොට ඇති ලේඛනය කොමිෂන් සභාවට ඉදිරිපත් කොට ඇත. නමුත් එකී ලේඛනය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හෝ අභියාචනා පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කොට නොමැති බව නිරීක්ෂණය වී

ඇත. ඒ සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාව හමුවේ දක්වා ඇත්තේ පැමිණිලිකාරිය විසින් යම් හෙයකින් එකී ලේඛනය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හෝ අභියාචනා පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කලේ නම් නිසැකවම පැමිණිලිකාරියගේ දරුවා පාසලට ඇතුලත් කොට ගැනීමේ හැකියාව පවතින බවයි.

කෙසේ වෙතත් පළවන ශ්‍රේණියට දරුවා ඇතුලත් කර ගැනීමේ චක්‍රලේඛය ප්‍රකාරව පදිංචිය තහවුරු කිරීම සඳහා හිමිකම් ඔප්පුවක් ඉදිරිපත් කළ යුතු බවට අත්‍යාවශ්‍යතාවයක් පෙන්නුම් කර ඇති නමුත් එකී අවශ්‍යතාව තුලින් අපේක්ෂා කොට ඇති මූඛ්‍ය අරමුණ වන්නේ පාසලට ආසන්නම පදිංචිකරුවන්ගේ දරුවන් පාසලට ඇතුලත් කර ගැනීම සඳහා එය ප්‍රබල සාක්ෂියක් ලෙස අදාළ කොට ගැනීමය. එහිදී <u>පදිංචිය වෙනත් සාධක මගින් නිශ්චිතවම තහවුරු වන අවස්ථාවකදී සහ යම් අයදුම්කරුවෙකුගේ පදිංචිය සම්බන්ධයෙන් කිසිදු සැකසහිත භාවයක් මතුවී නොමැති අවස්ථාවකදී</u> හිමිකම් ඔප්පුව යන සාධකය මත ඉතා දැඩිව ක්‍රියා කරමින් ආසන්න පදිංචිකරුවෙකුට තම දරුවා පාසලට ඇතුලත් කොට ගැනීමට අවස්ථාව අහිමි වී යන්නේ නම් එමගින් චක්‍රලේඛය මගින් අපේක්ෂා කොට ඇති මූඛ්‍ය අරමුණට බාදා පැමිණෙනු ඇත. ප්‍රශ්නගත සිදුවීම තුල පැමිණිලිකාරියගේ පදිංචිය කිසිදු ආකාරයේ සැකසහිත වී නොමැති අතර පදිංචිය තහවුරු කිරීමේ වෙනත් ලේඛන 4ක් නිවැරදිව පැමිණිලිකාරිය විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කොට ඇත. එසේම ආසන්න වසර 5ක් සඳහා නිවැරදිව ඡන්ද හිමිකම පැවතීම තුළ ඒ සඳහා වන සම්පූර්ණ ලකුණු ඇය විසින් උපයාගෙන ඇත. එනම් පදිංචිය තහවුරු කොට ගැනීමේ ප්‍රධාන සාධක අතරින් හිමිකම් ඔප්පුව හැරුනු කොට අනෙක් සියලුම අවශ්‍යතා පැමිණිලිකාරිය විසින් තහවුරු කොට ඉදිරිපත් කොට ඇත. පදිංචි ස්ථානය රාජ්‍ය ආයතනයක් වන නාගරික සංවර්ධන අධිකාරිය සතුව පවතින ස්ථානයක් බවත් එකී පදිංචි ස්ථානය සම්බන්ධයෙන් මේ දක්වා හිමිකම් ඔප්පුවක් නිකුත් කොට නොමැති බවත් මුල් අවස්ථාවේ සිටම පැමිණිලිකාර පාර්ශවය විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලයටද කොමිෂන් සභාව හමුවේද කරුණු ඉදිරිපත් කොට ඇත. එවැනි පසුබිමක් තුළ නොපවතින හිමිකම් ඔප්පුවක් ඉදිරිපත් නොකිරීම යන කාරණය මත අනෙකුත් සියලු සාධක මගින් පදිංචිය තහවුරු වන අවස්ථාවකදී යම් ආසන්න පදිංචිකරුවෙකුට තමන්ට ආසන්නම පාසලට ඇතුලත් කොට ගැනීමට පවතින අවස්ථාව අහිමි කිරීම දැඩි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ලෙස කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

ඉහත සියළු කරුණු අභිබවා කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වී ඇති ප්‍රබලම අනෙක් සාධකය වන්නේ වගඋත්තරකාර තර්ස්ටන් විද්‍යාලීය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය පැමිණිලිකාරිය සම්බන්ධයෙන් නොසැලකිමත් හා අයුක්ති සහගත ලෙස සලකා ඇති බවය. වගඋත්තරකාර පාර්ශවය විසින්ම කොමිෂන් සභාවට ඉදිරිපත් කොට ඇති ලකුණු ලේඛනය පරීක්ෂා කොට බැලීමේදී එය ඉතාම නොසැලකිලිමත්ව හා අසාධාරණ ලෙස ක්‍රියා කොට ඇති ආකාරය තහවුරු වී ඇත. ඒ අනුව පැමිණිලිකාරියට එකී ලකුණු ලේඛනය සමග දෙපාර්ශවය විසින්ම ඉදිරිපත් කොට ඇති සියලු කරුණු සලකා බැලීමේදී පැමිණිලිකාරියට

පැහැදිලිවම ලකුණු 79ක් උපයා ගැනීමේ හැකියාව පවතින බවත් ආසන්නතාවය යටතේ පාසලට ඇතුළත් කොට ගැනීමේ අවම ලකුණු සීමාව ලකුණු 71 වන බවත් ඒ අනුව පාසලට ඇතුළත් වීමේ අත්‍යාවශ්‍ය සුදුසුකම පැමිණිලිකාරිය විසින් සපුරා ඇති බවත් අනාවරණය වී ඇත.

නිගමනය :-

ඒ අනුව ඉහත සියලු කරුණු සලකා බැලීමෙන් පසු වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියාකලාපය මගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය 12(1) ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කොට ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

මේ අනුව පැමිණිලිකාරියගේ දරුවා 2016 වසරේ තර්ස්ටන් විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට ඇතුළත් කොට ගැනීමට කටයුතු කළයුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2016.08.31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
**Chairperson**
**Human Rights Commission of Sri Lanka**

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය, - අවශ්‍ය පියවර ගැනීම සඳහා
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/